සැ. යු. - 2013.01.18 වැනි දින පළවූ අංක 1794 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,795 - 2013 ජනවාරි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2013.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 86 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 87 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 92 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 පෙබරවාරි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 පෙබරවාරි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ප්‍රවාහන අමාත්‍යාංශය**

ලංසු සඳහා ආරාධනයයි (IFB)

(ශ්‍රී ලංකා රජය අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති)

**කළුතර දකුණ සිට පයාගල දකුණ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය දීර්ඝ කිරීම**

කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ, අංක 01 ප්‍රවාහන අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිනිය විසින්, කළුතර කලපුවේ ඉවුර පළල් කොට කළුතර දකුණ සිට පයාගල දකුණ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ කටයුතු ඉටු කිරීම සඳහා පහත සඳහන් පරිදි මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. කොන්ත්‍රාත් අංකය SRS/F. 7018.

අදාල කාර්යය, කළුතර කළපුවේ ඉවුර පළල්කොට කළුතර දකුණ සිට පයාගල දකුණ දක්වා සකස් කිරීම අනුව වැඩපිළිවෙල සකස් කළ යුතු වේ. ඉදිකිරීම් කාලය දින 150කි.

(2) ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

(3) කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අපලේඛනගතවූ අයකු නොවිය යුතුය අතර පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතු වේ.

ලංසුකරුවා ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) C 3 හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි වී සිටිය යුතු අතර, වෙරළ කටයුතු පිළිබඳව විශේෂඥතාවයෙන් යුතු විය යුතු ය.

4. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට පහත සඳහන් අවශ්‍යතා ද තිබිය යුතු ය.

*(අ)* පසුගිය පස්වසර තුළ ඉටුකළ ඉදිකිරීම් කාර්යයන්හි ධාරිතාවයේ වාර්ෂික සාමාන්‍ය අවම වශයෙන් රුපියල් මිලියන 450 විය යුතු ය.

*(ආ)* පසුගිය වසර 10 තුළ ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස, මෙම කාර්යයට ස්වභාවයෙන් හා සංකීර්ණතාවයෙන් සමාන අවම වශයෙන් එක් කොන්ත්‍රාත්තුවක් නවීකරණය/ඉදිකිරීම සම්බන්ධව පළපුරුද්ද සහිත විය යුතු ය.

*(ඇ)* වෙනත් කොන්ත්‍රාත්තුමය බැඳීම් සඳහා වෙන් කළ පසු හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කළ අත්තිකාරම් ගෙවීම් හැර තිබිය යුතු අවම ණය පහසුකම් ප්‍රමාණය රුපියල් මිලියන 25 ට නොඅඩු විය යුතු ය. මෙය මෙම ව්‍යාපෘතියට පමණක් ම අදාල විය යුතු ය.

*(ඈ)* අවශ්‍ය වැඩබිම් කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය යුතු යඃ-

1. එක් සිවිල් ඉංජිනේරුවරයකු, බීඑස්සී ඉංජි. NDT සමග වසර 5 ක පළපුරුද්ද,
2. එක් තාක්ෂණ නිළධාරියෙකු, NDT, HNDE, NDES හෝ සමාන සුදුසුකම් සමග වසර 5 ක පළපුරුද්ද,
3. එක් වැඩ අධීක්ෂකවරයෙකු, NCT හෝ සමාන සුදුසුකම් සමග වසර 3 ක පළපුරුද්ද.

(5) උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ, දුම්රිය ගබඩා අධිකාරී වෙතින් (දුරකථන අංක 2438078/2436818) ලබාගත හැකි අතර, පහත සඳහන් ලිපිනයේ දී 9.00 පැය හා 15.00 පැය අතර කාලය තුළ, ලංසු ලිපිලේඛන පරීක්ෂා කොට බැලිය හැකි ය.

(6) ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 7,500 ගෙවීමෙන් හා කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ, දුම්රිය ගබඩා අධිකාරී වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට 2013.01.09 වැනි දින සිට 2013.02.11 දින දක්වා 900 පැය හා 1500 පැය අතර කාලය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිලදී ගත හැකි ය.

(7) ලංසු 2013.02.12 වැනි දින 1400 පැය හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාල භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

සභාපතිනි,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය,
අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

(8) සියලුම ලංසු සමග රුපියල් පහළොස් ලක්ෂයක් (රුපියල් 1,500,000.00) වටිනා ලංසු ඇපකරය බැගින් තිබිය යුතු ය. එම ලංසු ඇපකරය ලංසු භාර ගැනීම අවසන් කරනු ලබන දිනයේ සිට දින 119ක් දක්වා වලංගු විය යුතු ය. ලංසු දින 91ක් දක්වා වලංගු විය යුතු ය.

(9) මේ සම්බන්ධව පෙර ලංසු හමුවක් 2013.01.28 වැනි දින 14.00 පැයට ප්‍රවාහන අමාත්‍යාංශයේ දී පැවැත්වීමට නියමිතය.

සභාපතිනි,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය.

අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

01-719

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

හැව්ලොක් ටවුම හැව්ලොක් සිටි, පාක් ටවර්, අංක 0506 හි පදිංචිව සිටි, දැනට අංක 9, ඩැන්ජෙරා පෙදෙස, දකුණු මොරැන්, ඔස්ට්‍රේලියා 3752 හි දැනට පදිංචි (විදේශ ගමන් බලපත්‍ර අංක N 3170060) හිමි වතුමුල්ලගේ සිසිලියා ඇන්ඩ්‍රොවීනා සොනාලි සේනානායක විවාහයට පෙර ප්‍රනාන්දු වන මම බ්‍රන්සිවික්, සිඩ්නි පාර, අංක 578 හි පදිංචි ඔස්ට්‍රේලියාවේ නීති වෘත්තිකයකු වන ජෝන් ඩී බ්‍රෙහනි විසින් ලියා සහතික කළ කොළඹ ඉඩම් කාර්යාලයේ අංක 201/205/10909 යටතේ 1999.12.13 වැනි දින ලියාපදිංචි කරන ලද (1) කටුබැද්ද, ආදර්ශ නගරය, 3 වැනි පටුමග, අංක 60-ඒ හි පදිංචි ලලිත නිමල් ජයසූරිය (ජා. හැ. අංක 543090603 V) සහ (2) කොළඹ 06, ස්ටැපඩ් ඇවනිව්, අංක 118/ඒ හි පදිංචි බ්‍රයන් ට්‍රාන්ෂෙල් (ජා. හැ. අංක 422092439 V) යන අය බද්ධ ඇටර්නි බලකරුවන් ලෙස නම් කරන ලද එකී ඇටෝනි බලපත්‍රය 2013.01.01 දින සිට බලරහිත කරන ලද බව ශ්‍රී ලංකාවේ ජනතාවට හා මෙයට අදාල සියලු පාර්ශවයන්ට මෙයින් දැනුම් දෙමි. ඉහත සඳහන් ලලිත නිමල් ජයසූරිය සහ බ්‍රයන් ට්‍රාන්ෂෙල් යන අයට ම විසින් බලය පවරා දෙන ලද එකී බද්ධ ඇටර්නි බලකාරත්වය 2013.01.01 දින සිට අවසන් කරන ලද බව සියලු දෙනාම මෙයින් දැනගනිත්වා.

ඇටර්නි අධිපති.

01-770

---

## ජෝර්ජ් ස්ටුවර්ට් ඔප්ටිමයිස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

පෙර ජෝර්ජ් ස්ටුවර්ට් ක්‍රියේෂන්ස් (පීවීටී) ලිමිටඩ්)

**සමාගම් ලියාපදිංචි අංකය : පී වී 16367**

*සමාගමෙහි නම වෙනස් කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමයි*

පූර්ව ජෝර්ජ් ස්ටුවර්ට් ක්‍රියේෂන්ස් (පීවීටී) ලිමිටඩ්

2012 දෙසැම්බර් මස 03 වැනි දා සිට බලපවත්වන පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව, ජෝර්ජ් ස්ටුවර්ට් ඔප්ටිමයිස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යනුවෙන් වෙනස් කළ බව 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලබයි.

සමාගම් ලියාපදිංචි අංකය : පී වී 16367
ලියාපදිංචි ලිපිනය : "ස්ටුවර්ට් හවුස්" අංක 45, ජනාධිපති මාවත,
කොළඹ 01

ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පනි ලිමිටඩ්,
(සමාගම වෙනුවෙන් වූ සමාගම් ලේකම්වරු)

"ස්ටුවර්ට් හවුස්" අංක 45,
ජනාධිපති මාවත, කොළඹ 01.

01-754

---

## ජෝර්ජ් ස්ටුවර්ට් රෙක්රූට්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

(පෙර ජෝර්ජ් ස්ටුවර්ට්ස්) රෙක්රූට්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

**සමාගම් ලියාපදිංචි අංකය : පී වී 5524**

*සමාගමෙහි නම වෙනස් කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමයි*

පූර්ව ජෝර්ජ් ස්ටුවර්ට්ස් රෙක්රූට්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

2012 දෙසැම්බර් මස 11 වැනි දා සිට බලපවත්වන පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව, ජෝර්ජ් ස්ටුවර්ට් රෙක්රූට්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යනුවෙන් වෙනස් කළ බව 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලබයි.

සමාගම් ලියාපදිංචි අංකය : පී වී 5524
ලියාපදිංචි ලිපිනය : "ස්ටුවර්ට් හවුස්" අංක 45, ජනාධිපති මාවත,
කොළඹ 01

ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පනි ලිමිටඩ්,
(සමාගම වෙනුවෙන් වූ සමාගම් ලේකම්වරු)

"ස්ටුවර්ට් හවුස්" අංක 45,
ජනාධිපති මාවත, කොළඹ 01.

01-753

---

## ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්ඩස්ට්‍රීස් (පීවීටී) ලිමිටඩ්

(පෙර ලීඩා ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්)

**සමාගම් ලියාපදිංචි අංකය : පී වී 21354**

*සමාගමෙහි නම වෙනස් කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමයි*

පූර්ව ලීඩා ඉන්ඩස්ට්‍රීස් (පීවීටී) ලිමිටඩ්

2012 නොවැම්බර් මස 28 වැනි දා සිට බලපවත්වන පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව, ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යනුවෙන් වෙනස් කළ බව 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලබයි.

සමාගම් ලියාපදිංචි අංකය : පී වී 21354
ලියාපදිංචි ලිපිනය : "ස්ටුවර්ට් හවුස්" අංක 45, ජනාධිපති මාවත,
කොළඹ 01

ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පනි ලිමිටඩ්,
(සමාගම වෙනුවෙන් වූ සමාගම් ලේකම්වරු)

"ස්ටුවර්ට් හවුස්" අංක 45,
ජනාධිපති මාවත, කොළඹ 01.

01-752

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි

සමාගම් නාමය : සින්ටො ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 89905
ලියාපදිංචි කළ දිනය : 2012.12.12
කාර්යාල ලිපිනය : මූතුහේන වත්ත, දික්හැතැප්ම, මීගොඩ.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

01-748

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : අෂාහි ට්‍රේඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 77035
ලියාපදිංචි දිනය : 2012.02.08
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : දීයවල, වැවගම, කුලියාපිටිය.

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්.) සමාගම,
සමාගම් ලේකම්වරු.

01-710/1

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : එන්. එච්. එස් ට්‍රේඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 77991
ලියාපදිංචි දිනය : 2012.03.29
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : දීයවල, වැවගම, කුලියාපිටිය.

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්.) සමාගම,
සමාගම් ලේකම්වරු.

01-710/2

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

සමාගමේ නම : නිහෝන් ලංකා හොලිඩේ (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 87451
ලියාපදිංචි කළ දිනය : 2012.08.16
ලියාපදිංචි ලිපිනය : අංක 233/3, රත්මල්දෙණිය පාර, පන්නිපිටිය.

සමාගම් ලේකම්.

01-709

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

පාදුක්ක කොළඹ පාරේ අංක 56/1 පදිංචි බොලොන්ජෝගේ බන්දුසිරි බොලොන්ජෝ (ගුවන් ගමන් බලපත්‍ර අංක 34606856) විසින් වාද්දුව මොල්ලිගොඩ කොලොන්ගස් වත්ත පිරිවෙන පාරේ අංක 123/8 හි පදිංචි බොලොන්ජෝගේ සමිත් බොලොන්ජෝ (ජා. හැ. ප. අංක 782242318 වී) වෙත ප්‍රදානය කළ කළුතර ප්‍රසිද්ධ නොතාරිස් බී. එච්. නලින් ආර්. පෙරේරා මහතා විසින් සහතික කරන ලද 2010 ජූලි මස 30 දිනැති අංක 3955 ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කළ බවත් මින් ඉදිරියට එකී බොලන්ජෝගේ සමිත් බොලොන්ජෝ විසින් මා වෙනුවෙන් සිදුකරන්නාවූ කිසිදු ගණුදෙනුවක් සම්බන්ධව මා විසින් කිසිදු ආකාරයක හෝ වගකීමක් නොදරණ බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුවට හා එහි ජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

බොලොන්ජෝගේ බන්දුසිරි බොලොන්ජෝ.

01-705

---

### දැන්වීමයි

හෝමාගම, කටුවන පාර, අංක 266 දරන ස්ථානයේ පදිංචි ලංකාතිලක කමලනාථ ජයවීර (ජා. හැ. අංක 553091411 වී) යන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට යථා පරිදි දන්වා සිටින වග නම් හෝමාගම, කටුවාන, 7 වැනි පටුමග අංක 290/2, දරන ලිපිනයේ පදිංචි මිල්ලසිංහගේ සුමනදාස යන අයට මා විසින් ප්‍රදානය කරන ලද 2007.12.04 වැනි දින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2012.12.04 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බවත් මින් මතුවට එහි කිසිම වලංගුතාවයක් නොමැති බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ලංකාතිලක කමලනාථ යන අයගේ ඇටෝර්නි බලකරු.

01-704

### දැන්වීමයි

හෝමාගම කටුවාන පාර, අංක 266 දරන ස්ථානයේ පදිංචි ලංකාතිලක කමලනාථ ජයවීර (ජා. හැ. අංක 553091411 V) යන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට යථා පරිදි දන්වා සිටින වග නම්, අංක 265/බී, කටුවාන පාර, හෝමාගම දරන ලිපිනයේ පදිංචි තුවාන් නිලාම් කමල්ඩීන් (ජා. හැ. අංක 613264434 V) යන අයට මා විසින් ප්‍රදානය කරන ලද 2010.10.07 වැනි දින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2012.12.08 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බවත් මින් මතුවට එහි කිසිම වලංගුතාවයක් නොමැති බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ලංකාතිලක කමලනාථ යන අයගේ ඇටෝර්නි බලකරු.

01-703

---

### සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : ජේ. ටී. ඉන්වෙස්ට්මන්ට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 89926
සංස්ථාගත කළ දිනය : 2012 දෙසැම්බර් මස 13 වැනි දින
ලියාපදිංචි ලිපිනය : දෙනුවල, අහංගම.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

01-702/3

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි

සමාගමේ නම : වීටස් ඇග්රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90196
සංස්ථාගත කළ දිනය : 2012 දෙසැම්බර් මස 26 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 2805, හිල්ටන් රෙසිඩන්සීස්, යුනියන් පෙදෙස, කොළඹ 02.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

01-702/2

---

### සමාගමේ නම වෙනස්වීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව, 2012 දෙසැම්බර් මස 13 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් සමාගමේ නම වෙනස්වීම (8 වැනි වගන්තිය ප්‍රකාරව) පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි

කලින් තිබුණු නම : ආර්. ඒ. ඩබ්ලිව්. රබර් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 60049
ලිපිනය : අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02
නව නාමය : ඉන්ටග්‍රේටඩ් සින(ර්) ජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

01-702/1

---

### සමාගමේ නාමය වෙනස් කිරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ එහි 9 (2) කාණ්ඩයට අදාළ නීති ප්‍රකාරව ජනතාව වෙත මෙයින් (8 වැනි කාණ්ඩයට අනුකූලව) දැනුම් දෙන වග නම් 2012 දෙසැම්බර් මස 26 වැනි දින පහත සඳහන් සමාගමේ නාමය වෙනස් කර තිබෙන බව ය.

සමාගමේ පැවති නාමය : සී. එච්. එච්. මෝල්ඩිව්ස් පුද්ගලික සමාගම
සමාගමේ අංකය : P V 81680
ලියාපදිංචි කාර්යාලය : අංක 327, යුනියන් පෙදෙස, කොළඹ 02
සමාගමේ නව නාමය : ප්‍රෙස්ට්‍රීජ් ඇනිලානා ලෙෂර් හොල්ඩිංස් පුද්ගලික සමාගම.

ප්‍රියන්ත මද්දුමගේ,
සමාගම් ලේකම්.

01-699

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. එම්. මුබාරක් විසින් ලියා සහතික කරන ලද අංක 10472 සහ 2012.09.10 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් කොළඹ 15, මට්ටක්කුලිය ෆර්ගියුසන් පාර අංක 421/1 හි පදිංචි රාමසාමි මාඩසාමි වන මා විසින් මාවනැල්ල, කිරුන්ගදෙණිය, අංක 82 හි පදිංචි බාවා කුන්චි ජුනයිදීන් යන අය වෙත පවරා දෙන ලද ඇටර්නි බලතල මෙයින් සම්පූර්ණයෙන් අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

තව ද, එකී බාවා කුන්චි ජුනයිදීන් විසින් එකී ඇටර්නි බලපත්‍රය මත සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මෙයින් පසු මා විසින් කිසිදු වගකීමක් නොදරන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

රාමසාමි මාඩසාමි.

01-674

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : අම්පාර ඩිස්ට්‍රික් කන්ෆෙඩරේෂන් ඔෆ් සස්ටේනබල් ඇග්‍රිකල්චර් රිසෝස් සෙන්ටර්ස් (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ අංකය : GL 2220
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : D 731/01, මහනුවර පාර, අම්පාර
සංස්ථාගත කිරීමේ දිනය : 2012.12.13.

බ්‍රිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

01-673

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

ඉහත සඳහන් කරන ලද සමාගම් පනතේ 8 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, 2013 ජනවාරි මස 03 වැනි දින සිට මයික්‍රෝ ෆයිනෑන්ස් ඇන්ඩ් කන්සල්ටන්සි පුද්ගලික සමාගමෙහි නාමය ට්‍රිනිටි ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම ලෙස වෙනස් කරනු ලැබ ඇත.

සමාගමේ නම : ට්‍රිනිටි ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම
සමාගමේ අංකය : PV 82027
ලියාපදිංචි ලිපිනය : අංක 73/2F , එකමුතු මාවත, මාවිත්තර, පිළියන්දල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වයි. එච්. එස්. ජී. ආර්. හෙට්ටිආරච්චි,
සමාගම් ලේකම්,
ට්‍රිනිටි ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම.

01-664

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර, ගොමගොඩ, අංක 32 දරන ලිපිනයේ පදිංචි සුභ පණ්ඩිත මුදියන්සේලාගේ මහේන්ද්‍ර විජේරත්න වන මා විසින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ශිරෝමි පී. නියාගම විසින් 2012 ජූලි 31 වැනි දින සහතික කරන ලද අංක 3988 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මැණික්හින්න, කලාසිරිගම අංක 18 දරන ලිපිනයේ පදිංචි හාරිස්පත්තුවලෑ ගෙදර ධර්මදාස නමැති අයට පවරන ලද ඇටෝර්නි බලය 2013.01.02 වැනි දින සිට අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

01-661

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ටයිටන් පැකේජිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 85697
ලියාපදිංචි කාර්යාලය : අංක 312/22, හපුගේ වත්ත, මාපිටිගම පාර, දොම්පේ
ලියාපදිංචි දිනය : 2012.04.30

සමාගමේ ලේකම්වරු.

01-652

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

සමාගම් නාමය වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සමාගම් නාමය වෙනස් කරන ලදී.

සමාගමේ පෙර නාමය : හැරිසන්ස් කෙමිකල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 14353
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 330, ටී. බී. ජයා මාවත, කොළඹ 10
සමාගමේ නව නාමය : හාක්‍රොස් කෙමිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් 2012.12.19 වැනි දින සිට වෙනස් කළ බව නිවේදනය කරන ලදී.

ලේකම්.

01-651

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : රියෝ ලංකා ඉන්ටීරියර්ස් (පී. වී. ටී) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 90175
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 485/1, 10 වැනි කණුව, වේරහැර, බොරලැස්ගමුව
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.12.26.

01-618/1

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : රොමැටෝ ඉංජිනියරින් (පී. වී. ටී) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 89953
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 51, රෝස් වුඩ් පාර්ක්, ගෝනහේන පාර, රන්මුතුගල, කඩවත
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.12.14.

01-618/2

## මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර ඒසියන් රෙකෝර්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2012 සැප්තැම්බර් මස 26 වැනි දින සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඒසියන් රෙකෝර්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම අංකය : P V 88477
ලියාපදිංචි කාර්යාලය : අංක 29 ඒ, පන්සල පාර, කළුබෝවිල, දෙහිවල.

අණ පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලය.

01-616

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 (1) වගන්තිය

සමාගමේ නම : පාම් උණවටුන (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 89476
ලියාපදිංචි ලිපිනය : හේනවත්ත, තල්දූව, අහංගම

සමාගමේ නම : කුබේරා ලක්ෂ්මී ඉන්වෙස්ට්මන්ට්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 89508
ලියාපදිංචි ලිපිනය : බිම් මහල, සයුරු සෙවන, අංක 46/12, නවම් මාවත, කොළඹ 02.

(සමාගම් ලේකම් කාර්යාලය)

01-600

## දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : හින්දාවී සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 81375
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 561/5, මෛත්‍රීපාල සේනානායක මාවත, 2 වැනි පියවර, අනුරාධපුරය.
සංස්ථාගත කළ දිනය : 2011 සැප්තැම්බර් මස 20 වැනි දින.

බියන්විලගේ රසාංග චින්තක පෙරේරා,
අධ්‍යක්ෂ.

01-626

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : කරින්ද්‍ර එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 88937
සංස්ථාගත කළ දිනය : 2012 ඔක්තෝබර් මස 18 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 51/A මාතලේ පාර, අඹතැන්න.

අධ්‍යක්ෂක.

01-629

## සමාගමක් ලියාපදිංචි කිරීමේ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ 2008 ජූලි 08 වැනි දින පහත විස්තර සඳහන් ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත කැන්රි සුපර් ක්ලීන් පී. වී. ටී. එල්. ටී. ඩී.
ලියාපදිංචි ලිපිනය : අංක 416/8ඒ 4, මාකුඹුර, පන්නිපිටිය
ලියාපදිංචි අංකය : පී වී 64745.

01-599

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් ඇපයෙන් සීමිත සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එල් පී ජී ඇසෝසියේෂන් ඔෆ් ශ්‍රී ලංකා (L P G ASSOCIATION OF SRI LANKA)
ලියාපදිංචි කළ දිනය : 2012.12.17
සමාගමේ අංකය : ජී ඒ 2771 (G A 2771)
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14, ආර්. ඒ ද මෙල් මාවත, කොළඹ 04.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

නීතිඥ කීර්ති පතිරාජ,
සමාගම් ලේකම්.

01-627

**ප්‍රසිද්ධ දැන්වීමයි**

පහත සඳහන් වගකීමෙන් සීමිත සමාගම් 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *සමාගමේ නම* | *පී වී අංකය* | *ලියාපදිංචි කළ කාර්යාලය* |
|---|---|---|
| සදර්න් ඇක්සස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 89515 | සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| ඩිජිටල් සිටි සෙන්ට්‍රල් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 89930 | අංක 110 4/3, ස්ටැෆර්ඩ් ඇවනිව්, කොළඹ 06 |
| ස්ටැන්හෝප් ලේන් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 90011 | සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| ඩල්වේ ලේන් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 90012 | එම |
| ගෙකී (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 63707 | අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| හයිලන්ඩ් විලා (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 63706 | හයිලන්ඩ් විලා, අභිමානගම, වැලිගම. |

සමාගම් ලේකම්වරු.

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 10,
හැව්ලොක් පෙදෙස,
කොළඹ 05.

01-653

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව**
(පෙර වයඹ සංවර්ධන බැංකුව)

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තිය ලෙස පැවති, වර්තමානයේ 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වැනි වගන්තිය, යටතේ බලය පවරන ලද, 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණිය හත්පත්තුවේ, රැකෝපත්තු කෝරළේ, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කොහාන සහ දමුණුගල ග්‍රාමයන්හි පිහිටි කොහාන සඳගල ජනපදය ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1994 ජූනි මස 26 වැනි දිනැති අංක 110/94 දරන පිඹුරේ ලොට් අංක 80සී ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය. ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 02 පර්. 0 එහි පිහිටි සියල්ල සහිතව.

බලයලත් මිනින්දොරු ඊ. ඒ. ජී. එදිරිසිංහ විසින් සාදන ලද, 1999 මාර්තු මස 16 වැනි දිනැති අංක 28/99 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය. ඉඩමේ ප්‍රමාණය .- අක්. 0 රූඩ් 01 පර්. 36.5. එහි පිහිටි සියල්ල සහිතව සහ අංක 110/94 දරන පිඹුරේ දැක්වෙන අඩි 10ක් පළලැති මාර්ගයේ භාවිත අයිතිය ද සමග.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2013 පෙබරවාරි මස 12 වැනි අඟහරුවාදා දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා 2005.09.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2006.03.29 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

වෙන්දේසිකරු වෙනස්කිරීම පිළිබඳ දැන්වීම සඳහා 2011.04.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, 2011.03.30 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*අදාළ දේපළ වෙත පිවිසීම.-* කුරුණෑගල මීගමුව පාරේ කිලෝමීටර් 07ක් පමණ එනම් පිදුරුවැල්ල මංසන්ධිය දක්වා පැමිණ එතැනින් දකුණට එනම් සඳගල ගම්සභා පාරට හැරී තවත් කිලෝමීටර් 2ක් පමණ යන විට ට්‍රයිකෝ කාර්ගෝ කම්පනිය හමුවේ. එතැන් සිට තවත් මීටර් 100ක් පමණ ගොස් ඔබගේ දකුණට ඇති පාරට පිවිසෙන්න. මෙම පාරේ තවත් මීටර් 100ක් පමණ ගියතැන වම්පසින් ඇති පාරේ මීටර් 75ක් පමණ ගියවිට ඉහත කී දේපළ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25%ක් (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. විකුණුම් සම්බන්ධ හෝ වෙනත් යම්කිසි ගාස්තුවක් පවතී නම් එම ගාස්තුව,
6. විකුණුම් සහතිකයට අදාළ මුද්දර බද්ද.

ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වයඹ පළාත් කාර්යාලය අංක 155 මීගමුව පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් ආකාරයට අදාළ දින 30 ඇතුළත ගැණුම් මිලෙහි ඉතිරි මුදල නොගෙවන අවස්ථාවක දී දැනටමත් ගෙවන ලද මුදල (25%) අහිමි කිරීමට සහ අදාළ දේපළ නැවත වෙන්දේසි කිරීමේ අයිතිය බැංකුව සතුයි.

අදාළ දේපළ සම්බන්ධ ඔප්පු සහ අනෙකුත් විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක 037-2227567, 037-2227429, 037-2234350, 037-2234360 ෆැක්ස් අංකය : 037- 2220013.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ශොක්මන් සහ සමරවික්‍රම.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1892.com.

වෙබ් අඩවිය :www.sandslanka.com

01-717

---

## මහජන බැංකුව - නිට්ටඹුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

කලගෙඩිහේන කලටුවාව උතුර, අංක 27 හි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි පර්චස් හතලිහ (අ. 0 රූ. 0 පර්. 40) ක නිවසක් සහිත වටිනා බිම් කොටස, මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2013.02.14 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2007.10.05 දින ද, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2007.11.27 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - නිට්ටඹුව නගරයේ සිට නුවර කොළඹ මාර්ගයේ තිහාරිය දක්වා පැමිණ තිහාරිය හංදියෙන් වමට ඇති වාරණ පාරේ කි. මී. 1.6ක් පමණ ගමන් කරන විට ගොඩැල්ල හන්දිය හමුවේ. ඉන් වමට හැරී මීටර් 400ක් පමණ (වතුපිටිවල පාර) යන විට දුනුඇල හන්දිය හමුවේ. ඉන් වමට හැරී මීටර් 400ක් පමණ යන විට පාරේ වම් පසින් පාරට මායිම්ව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුු වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමනාකරු මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව, ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක : 033-2222325, 033-2225008, 033-2231901
ෆැක්ස් අංක : 033-2226165, 033-2226741.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා තැබීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ශොක්මන් සහ සමරවික්‍රම,
වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1892.com.

වෙබ් අඩවිය ::www.schokmanandsamerawickreme.com

01-718

### මහජන බැංකුව - ලකී ප්ලාසා ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, උඩහමුල්ල දුම්රිය පටුමගේ "කුරුදුවත්ත" නැමති ඉඩමට බලයලත් මානක ඩී. ඒ. වීරක්කොඩි මහතාගේ අංක 712 සහ 2000.04.26 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක "4" හි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් විසි පහ (අ. 0 රූ. 0 පර්. 25) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි ආදී සියලු දේ ද වේ.

(2) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ උඩහමුල්ල දුම්රිය පටුමගේ "කුරුදුවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඒ. වීරක්කොඩි මහතාගේ අංක 712 සහ 2000.04.26 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක "3" හි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් පහලොවයි දශම හයයි බින්දුව (අ. 0 රූ. 0 පර්. 15.60) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි ආදී සියලු දේ ද වේ.

(03) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, උඩහමුල්ල දුම්රිය පටුමගේ "කුරුදුවත්ත" නැමති ඉඩමට බයලත් මානක ඩී. ඒ. වීරක්කොඩි මහතාගේ අංක 712 සහ 2000.04.26 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක "2" හි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් දාහතයි දශම තුනයි බින්දුවක් (අ. 0 රූ. 0 පර්. 17.30) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි ආදී සියලු දේ ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2013.02.17 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* වර්ෂ 2010.02.27 වැනි දින ද, 2010.02.15 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* .- දෙල්කඳ හන්දියේ සිට වම් පසට ඇති පාරේ මීටර් 05ක් පමණ ගිය විට හමුවන පරණ කැස්බෑව පාරෙහි දකුණට ඇති උඩහමුල්ල දුම්රිය පාරේ උඩහමුල්ල දුම්රියපොල අසලින් වම් පසට මීටර් 5ක් පමණ ගිය විට උඩහමුල්ල දුම්රියපොල 2 වැනි පටුමගෙහි දකුණට ඇති දේපළ වේ.

*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :

1. ගැනුම් මිලෙන් 10% ක් ද ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් ද;
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද;
4. ලිපිකරු සහ නිවේදකයේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද;
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (බටහිර 01), ආදිපාද වීදිය, කොළඹ 1 හි ප්‍රධාන කළමනාකාර මහතාට ගෙවිය යුතු ය.

දුරකථන අංක : 011-2344983, 2344984
ෆැක්ස් අංකය : 011 - 4717009.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම).

*කාර්යාලය* : අංක 25 "බී", බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5756356, 071-2334808
නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ
දුරකථ අංක : 011 2419126, 071-8760986.

01-757

---

### මහජන බැංකුව - දංකොටුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසේ දංකොටුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයට අයත් දකුණු පිටිගල් කෝරළයේ, ඕතර පළාතේ, "ලිහිරියාගම" නැමති ගමේ පිහිටි "මහයාය වත්ත" අංක 03 නැමැති ඉඩමට සර්වේජනරාල් වරයාගේ අංක මු. පී. ප්‍ර. 2130 දරන පිඹුර ප්‍රකාරව ලොට් අංක "161" හි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් තිස්හතරයි දශම තුනයි අටක් (අ. 0 රූ. 0 පර්. 34.38) ක් හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි අටයි හතක් (හෙක්. 0.087) විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ පළතුරු, ගොඩනැගිලි යනාදී සියලු දේ ද සමග වේ. (මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පුත්/වෙන්. 38/94 හි ලියාපදිංචි වී ඇත) සහ තවද, ඉහත කී ඉඩමට ප්‍රවේශ වීමට ඇති සියලුම මාර්ගයන් පොදුවේ පාරවල් වශයෙන් භාවිතා කිරීමේ මාර්ග පරවශතාවය ද සමග වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2013.02.22 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා වර්ෂ 2010.05.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, වර්ෂ 2010.06.07 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත්වල පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* .- දංකොටුව නාත්තන්ඩිය මාර්ගයේ මාවතගම හන්දියෙන් දකුණට හැරී බුජ්ජම්පොල පාරේ පන්සල පසු කර ලිහිණියාගම හන්දියෙන් වමට ඇති රටමැද පාරේ සැ. 1/4ක් පමණ ඉදිරියට (මීටර් 280ක්) යන විට වම් පස හමුවන ජයගම පළමු පාරේ මීටර් 200ක් පමණ යන විට හමුවන වමට විහිදෙන වැලි පාරේ මීටර් 125ක් පමණ ගිය පසු පාරට යාව දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්);
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% (සියයට එකක්) ද;
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද;
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද;
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (පුත්තලම), මහජන බැංකු ගොඩනැගිල්ල (උඩු මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය, ප්‍රාදේශීය කලමනාකාර මහතා වෙත ගෙවිය යුතු ය. දුරකථන අංක : 032-2253300, 2253301, 2255142, ෆැක්ස් අංකය : 032-225247.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම).

*කාර්යාලය* : අංක 25 "බී", බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5756356, 011-2334808
නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ
දුරකථ අංක : 011 2419126, 071-8760986.

01-758

---

**මහජන බැංකුව - ලිබර්ටි ප්ලාසා ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ, දෙබැද්දේ, වස්කඩුව වාද්දුවේ මැලෑගම පිහිටා ඇත්තාවූ ද, බලයලත් මිනින්දෝරු එම්. ඒ. සේතුංග විසින් සාදන ලද 1972. 12.15 වැනි දින අංක 1150 දරන පිඹුරේ නිශ්චිතව දක්වා ඇති "මැලෑගම වත්ත " යනුවෙන් හඳුන්වනු ලබන, ලොට් 183 ලෙස ලකුණු කර ඇති ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම පහයි බින්දුවක් වූ (අ. 0 රූ. 0 පර්. 24.50) විශාල ඉඩම් සහ ඊට අයත් ගොඩනැගිලි ගහකොළ පළතුරු සහ වෙනත් සියලුම දේ ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2013ක් වූ පෙබරවාරි මස 16 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2012.11.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2012.10.31 වැනි දින රජයේ පුවත්පත් වන දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත්වල පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* .- කොළඹ සිට ගාල්ල පාරේ වාද්දූව දක්වා ගොස් එම හන්දියෙන් වම් පස පිහිටි මොරොන්තුඩුව පාරේ කි. මී. 02ක් පමණ ගිය පසු වම් පස ප්‍රධාන පාරට මුහුණ ලා මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්);
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% (සියයට එකක්) ද;
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද;
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද;
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් 80%ක් වූ (සියයට අසූවක්) මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (බටහිර 01) ආදිපාද වීදිය, අංක 11 හි ප්‍රධාන කළමනාකාර මහතාට ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම).

දුරකථන අංක : 2344983, 2344894, ෆැක්ස් අංකය : 011-4717009
*කාර්යාලය* : අංක 25 "බී", බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5756356, 2334808
නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ
දුරකථ අංක : 011 2419126, 071-8760986.

01-759

**සෙලාන් බැංකුව පීඑල්සී - බොරලැස්ගමුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ දෙදෙනාම පිළියන්දල පදිංචි ගබඩාගේ දොන් රූපදේව ප්‍රේමකුමාර සේනාරත්න සහ කේශරී ප්‍රතිභා රත්නායක යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව සුළු නගර සභා සීමාව තුළ මාම්පේ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 17 දිනැති අංක 8456 දරන සැලැස්මේ නිරූපනය කරනු ලබන එගොඩහේන ගෲප් නමැති, එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 31 බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එකී අංක 8456 දරන සැලැස්ම අනුව පර්චස් හතක් (අ. 0 රූ. 0 පර්. 7) විශාල ඉඩම.

එකී ඉඩම් කොටස බලයලත් මිනින්දෝරු එන්. ඊ. ජේ. සිල්වා විසින් සාදන ලද 1985.06.15 දිනැති අංක 196 දරන සැලැස්මේ නිරූපනය වන ඉඩමේ නැවත මැනීමක් වේ.

බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් සාදන ලද 1969.01.28 දිනැති අංක 702 දරන සැලැස්මේ නිරූපනය කරනු ලබන පාර සඳහා වෙන් කිරීම් උඩින් මාර්ග අයිතිය ද සමඟ ඉහත සඳහන් දේපළ 2013 පෙබරවාරි මස 15 වැනි දින පෙරවරු 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - පිළියන්දල සිට හොරණ පාරේ කි. මී. 1ක් පමණ ගිය විට ඇති මිරිස්වත්ත හංදියෙන් වම්පසට ඇති කොට්ටාව පාරට හැරෙන්න. (සිද්ධමුල්ල හරහා කොට්ටාව පිළියන්දල පාර) එම මාර්ගයේ තවත් මීටර් 400ක් පමණ ගිය විට වම්පසට ඇති වටනවත්ත පාරට හැරී මීටර් 225 ක පමණ දුරක් ගිය විට නැවතත් දකුණු පසට ඇති තාර පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 50 ක පමණ දුරක් ගිය විට වම්පසට ඇති අඩි 20 ක් පළල මාර්ගයට හැරී තවත් මීටර් 20ක පමණ දුරක් ගිය විට මාර්ගයේ වම්පස අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම .- රජයේ ගැසට් පත්‍රයේ* 2012.10.25 වැනි දින පළ වී ඇති අතර ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පතේ 2012.11.07 වැනි දින සහ තිනකුරල් පුවත්පතේ 2012.11.07 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකාරිනිය, (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-2456476, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940.

01-698

---

**සෙලාන් බැංකුව පීඑල්සී - සාරික්කමුල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ පානදුර පදිංචි බාලපුවදු මනුකුලසූරිය සුදත් නිශාන්ත මැන්දිස් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබද්ද කෙසෙල්වත්තෙහි පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. පී. සී. සිරිසෝම විසින් සාදන ලද 1989.10.14 දිනැති අංක 493 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මාලිම්බොඩයාවත්ත ලොට් ඒ 2 නමැති එහි පිහිටි සියලු දේ සමග ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් තුනයි දශම තුනක් (අ. 0 රූ. 0ප ර්. 3.3) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2013 පෙබරවාරි මස 15 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කෙසෙල්වත්ත මංසන්ධියේ සිට දිගරොල්ල පාර ඔස්සේ මීටර් 500ක් පමණ ඉදිරියට ගිය විට දකුණුපසට ඇති ගිම්පාත පාරට හැරී තවත් මීටර් 200ක් පමණ ගිය විට වරිපනම් අංක 36 දරන අදාළ දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම .- *රජයේ ගැසට් පත්‍රයේ* 2008.11.28 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2008.11.25 වැනි දින ද වීරකේසරි පුවත්පතේ 2008.12.17 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම

ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකාරිනිය, (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011-2456480, 2456476.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940.

01-697

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.